# කලාවැව ගොවිජනපද
# මහවැලිය ඇසුරේ ලැබූ පුනර්ජීවනය


| ප්‍රවේශ අංකය | 684 |
| --- | --- |
| වර්ග අංකය | |



ඩී. රත්නායක
F.G.S/H/MSSC 2006/04
සමාජ විද්‍යාපීඨය
කැලණිය විශ්ව විද්‍යාලය
කැලණිය.


2008.12.21

## සංක්ෂිප්තය

වාරිමාර්ග හා ගොවිජනපද සංවර්ධනය යුගයේ අවශ්‍යතාවයක් ලෙසින් ඉදිරියට පැමිණ ඇති මාතෘකාවකි. අද ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායක වන බහු කාර්ය ව්‍යාපෘතියක් ලෙස මහවැලි ව්‍යාපාරය හැඳින්විය හැක. එය සලකමින් මගේ අධ්‍යයන නිබන්ධ මාතෘකාව ලෙසින් ''කලාවැව ගොවිජනපද මහවැලිය ඇසුරේ ලැබූ පුනර්ජීවනය'' යන්න තෝරා ගතිමි. කලාවැව (එච් කලාපයේ) පදිංචිකරුවෙකු ලෙසින් මා ලද සැබෑ අත්දැකීම් මේ කාර්යය සඳහා මහඟු පිටුවහලක් විය. ''එච්'' කලාපයේ (කලාවැව) වාරිමාර්ග කාර්යාලය, කලාඔය ගංගා ද්‍රෝණි කාර්යාලය, කොළඹ මහවැලි කේන්ද්‍රය, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා තඹුත්තේගම ප්‍රදේශයේ මහවැලි ක්ෂේත්‍රයේ ඇතැම් නිලධාරීන්ගේ සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් තොරතුරු ද මේ නිබන්ධනයේ දී ප්‍රයෝජනවත් විය.

පළමුවෙනි පරිච්ඡේදයේ දී අතීතයේ සිට වාරිකර්මාන්ත සඳහා කරන ලද උත්සාහයන් හා අතීත වාරිතාක්ෂණය පිළිබඳ විස්තර වේ. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ආරම්භයට පෙර වාරිකර්මාන්ත හා කෘෂි කාර්මික සංවර්ධනයට ගන්නා උත්සාහයන් හා ප්‍රතිපත්ති ද ආඥා පනත් ද මේ පරිච්ඡේදයේ දී සාකච්ඡා වේ. ඒ ප්‍රයත්නයන්ගෙන් ගොවිජනපද සංකල්පය මතු වී ආ අයුරුත්, කලාවැව ගොවිජනපද ඇරඹීමත්, ඒවා කීපවිටක්ම අසාර්ථක වීමත් පිළිබඳ විස්තර වේ.

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ සංකල්පය හා ආරම්භය ද පියවරින් පියවර එහි ව්‍යාප්තිය ද සංවර්ධනය ද දෙවෙනි පරිච්ඡේදයේ දී සංඛ්‍යා දත්ත හා සිතියම් ඇසුරු කරගනිමින් සාකච්ඡා කර ඇත. කඩිනම් මහවැලිය මෙහිදී විශේෂයෙන් විස්තර කළ අතර මහවැලි ව්‍යාපාරයේ පුරෝගාමී කලාපය ලෙසින් කලාවැව ''එච්''කලාපයේ සැලසුම් හා ක්‍රියාකාරීත්වය තෙවෙනි පරිච්ඡේදයේ දී විස්තර වේ. එහි අද ප්‍රගතිය සංඛ්‍යා දත්ත හා ප්‍රස්තාර, චිත්‍ර ආදිය ද ඇසුරු කරගනිමින් විමර්ශනය කර ඇත.

සිව්වෙනි පරිච්ඡේදය මෙහිදී විශේෂත්වයක් දරයි. ඒ ''එච්'' කලාපයේ ප්‍රගතිය, පෙරළිය හා ගැටලු, සමාලෝචනය එහිදී සිදු වී ඇති හෙයිනි. කලාපයේ සංවර්ධනය මත පාරිසරික මෙන්ම සමාජමය ලෙසින් ඇති වූ ගැටලු ද මම විශේෂයෙන් උපුටා දැක්වූවෙමි. ඒ සඳහා මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භයට පෙර මේ කලාපයේ තත්ත්වය සමීක්ෂණ වාර්තාව ද මා හට මහත්සේ උපකාරී විය. ''එච්'' කලාපය එදා අද ලෙසින් මේ අනුව තාර්කිකව විවරණය කිරීමට හැකිවිය.

පස්වෙනි පරිච්ඡේදයේදී මේ සමීක්ෂණ තොරතුරු වලින් මා විසින් දකින ලද මහවැලි ''එච්'' කලාපයේ සංවර්ධනය මෙන්ම එහි ප්‍රමාණාත්මක බව ද ගුණාත්මක බව ද පෙන්වයි. ඒ තුළින් මතු වූ ගැටලු සඳහන් කරන අතර මාගේ නිගමනයන් සංවර්ධනයේ විවිධ අංශ ඔස්සේ හුවා දක්වමි.